# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2017

**තක්සේරු දෙපාර්තමේන්තුව**

**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

# තක්සේරු දෙපාර්තමේන්තුව




තක්සේරු දෙපාර්තමේන්තුව

අංක : 748,මරදාන පාර,

කොළඹ.

0112694381

0112694382

ෆැක්ස් : 0112694383

විද්‍යුත් තැපෑල : cv@valuationdept.gov.lk

## දෙපාර්තමේන්තුවේ ආකෘතිය (2018 පෙබරවාරි මස වන විට)

| | |
|---|---|
| රජයේ ප්‍රධාන තක්සේරුකරු | **පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ** |
| අතිරේක ප්‍රධාන තක්සේරුකරු | **ඒ.එස්.ඩබ්ලිව්.කේ. නානායක්කාර** |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු | **ජී.ඩී. සෙනෙවිරත්න** |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු | **රාජු යෝගනාදන්** |
| ප්‍රධාන ගණකාධිකාරී | **එම්.එන්.පී. ප්‍රනාන්දු** |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | **ඒ.එස්.ඩී. අලුත්ගේ** |
| <u>**පළාත් තක්සේරුකරුවෝ**</u> | |
| කොළඹ මහනගර පළාත් කාර්යාලය | **එම්.එල්.එස්. තරංගා** |
| බටහිර මධ්‍යම පළාත් කාර්යාලය | **ඩබ්ලිව්. ක්‍රිස්ටීන් ඊ.පෙරේරා** |
| බටහිර උතුර පළාත් කාර්යාලය | **අනුරාධ සෙනෙවිරත්න** |
| බටහිර දකුණ පළාත් කාර්යාලය | **බී. ජයසිරි** |
| දකුණු පළාත් කාර්යාලය | **ඒ.වී.එස්.ටී.කේ.අදිකාරම්** |
| දකුණු උප කාර්යාලය (හම්බන්තොට) | **කේ.ආර්.එන්. ජයවර්ධන** |
| මධ්‍යම I පළාත් කාර්යාලය | **කේ.කේ.ජී.යූ. බණ්ඩාර** |
| නියෝජ්‍ය මධ්‍යම II පළාත් කාර්යාලය | **ඒ.සී. ජයසිංහ** |
| උතුරු මැද පළාත් කාර්යාලය | **ඩී.ඩී.එස්.එස්. දම්පේ** |
| වයඹ පළාත් කාර්යාලය | **ජී.එස්. විජේවර්ධන** |
| සබරගමුව පළාත් කාර්යාලය | **ජී. එස්. පද්මසිරි** |
| ඌව පළාත් කාර්යාලය | **ඩී.එම්.කේ.එස්.බී. දිසානායක** |
| උතුරු පළාත් කාර්යාලය | **එස්. ජෙගනාදන්** |
| නැගෙනහිර පළාත් කාර්යාලය | **ඒ.පී.ජී. චන්ද්‍රරත්න** |
| මහනුවර පුහුණු මධ්‍යස්ථානය | **එච්.එම්. කීර්තිරත්න** |
| පර්යේෂණ සංවර්ධන පරීක්ෂණ සහ තොරතුරු සංනිවේදන අංශය (ICT) | **එල්.ජේ.ඩී.කේ. සිල්වා** |
| නීති නිලධාරි | **ඩී.එල්. විතාරණ** |
| පරිපාලන නිලධාරින් | **කේ.ඩබ්.ඒ.ඩී.එල්.පී. කරුණාසේකර** |
| | **කේ.පී.ආර්.එස්.කුමාරි කෙම්පිටිය** |

# පටුන


**දෙපාර්තමේන්තුවේ ආකෘතිය (2018 පෙබරවාරි මස වන විට)........................................... .....**

**පෙරවදන ......................................................................................................... 1**

**හැඳින්වීම ....................................................................................................... 2**

**මෙම වාර්තාව පරිශීලනය කරන ආකාරය ............................................................... 2**

**1 වන කොටස - දෙපාර්තමේන්තුවේ කටයුතු ........................................................... 4**

**1.1. අප ගැන.......................................................................................................4**

**1.2. දෙපාර්තමේන්තුවේ මූලික ක්‍රියාදාමයන්..................................................................5**

**1.3 අභියෝග හා උපාය මාර්ග......................................................................................7**

**2 වන කොටස - කාර්යසාධනය සහ විශ්ලේෂණය .......................................................... 9**

**2.1 අධ්‍යාපනික උන්නතිය...........................................................................................9**

**2.2 තක්සේරු කටයුතුවල කාර්ය සාධනය වාර්තා කිරීම,ප්‍රාග්ධන සහ කුලී තක්සේරු කිරීම....11**

**2.3. නිම කළ තක්සේරු වාර්තා (වර්ෂමය හා ඉලක්කගත)................................................13**

**2.4. සාමාන්‍ය තක්සේරු වාර්තා (ඉලක්කගත - නිමකළ - ප්‍රක්ෂේපිත)..............................14**

**2.5 වරිපනම් හා වරිපනම් ආශ්‍රිත තක්සේරු...................................................................15**

**2.6. වරිපනම් ප්‍රතිශෝධන කටයුතු - (වසරමය සහ ප්‍රක්ෂේපිත).......................................16**

**2.7. වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය..........................................................................17**

**2.8. වරිපනම් ආශ්‍රිත තක්සේරු කටයුතු........................................................................18**

**2.9. වරිපනම් තක්සේරු කටයුතු - (ඉලක්කගත- නිමකළ - ප්‍රක්ෂේපිත)............................19**

**2.10 ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය............20**

**2.11. රාජ්‍ය වත්කම් තක්සේරු කිරීම 2017...................................................................23**

**2.12 විශේෂ ව්‍යාපෘති...............................................................................................23**

***2.13* 2018 වර්ෂය සඳහා වරිපනම් තක්සේරු පුරෝකථනය..............................................31**

**2.14 පුහුණු පහසුකම් හා අනුග්‍රාහිත පුහුණු වැඩසටහන් - 2017.......................................34**

**3 වන කොටස - මූල්‍යකාර්යකරණය සහ විශ්ලේෂණය...................................................... 37**

**3.1 මූල්‍යකාර්යකරණ මිණුම්දඬු හා වාර්තාකරණය........................................................37**

**4 වන කොටස - අනුමත සේවක සංඛ්‍යාව හා මානව සම්පත................................................38**

**4.1 දෙසැම්බර් මස 31 වන දිනට සේවක සංඛ්‍යාව..........................................................38**

# පෙරවදන

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂී දායකත්වයක් සපයන බව පොදු මහජනතාව විෂයෙහි ප්‍රකට කරුණකි. මෙම දෙපාර්තමේන්තුව සපයන සේවාවන්, පළාත් පාලන ආයතනයනට අයත් දේපළ සඳහා වරිපනම් අංක වෙන්කරදීම හෝ රජයේ නිල නිවාස සඳහා ආර්ථික කුලී වටිනාකම තක්සේරු කිරීම වැනි කාර්යයන්ගේ සිට රාජ්‍ය ව්‍යාපාරික ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම අරභයා ව්‍යාපාර තක්සේරුකරණය හා අනිවාර්ය ගැනුම් බලතල යටතේ සංවර්ධන ව්‍යාපෘති සඳහා හිමිකම පවරා ගන්න ලද ඉඩම් සඳහා වන්දි මුදල් තක්සේරුකරණය වැනි කාර්යයන් දක්වා පුළුල් පරාසයක විහිදෙන්නකි.

2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාව තුළ අප දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම, මෙහෙවර සහ අරමුණු හා වගකීම් මනාව පිළිබිඹු වේ.2016 වර්ෂයට වඩා විශාල ප්‍රමාණයේ වැඩ ධාරිතාවක් සාක්ෂාත් කර ගැනීම උදෙසා අපගේ මානව හා භෞතික සම්පත දායකකර දුන් ශක්තියත්, අපදැරූ සාමූහික ප්‍රයත්නය ආශ්‍රිත උපාය මාර්ගික කාර්ය සාධනයත් ඊට සාක්ෂි දරයි.

අපගේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ජන රජයේ අතිගරු ජනාධිපතිතුමන්ද ගරු මුදල් අමාත්‍යතුමන්ද, ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමන්ද, ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමන්ද, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලයද විසින් මා වෙත හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දක්වන ලද සහයෝගය මම ඉතා කෘතඥා පූර්වකව සිහි කරමි.

අපගේ සේවදායකයන් සමග සහයෝගයෙන් ඉලක්කගත කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා වෙහෙස නොබලා කැපවෙමින් ඉතා ඉහළ මට්ටමේ උනන්දුවක් සහිතව සිය සේවාවන්හි නියැලි තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ වෘත්තීයමය තත්වය පවත්වා ගන්නා අතරම රාජ්‍ය ආයතන, පළාත් සභා,පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා බැංකු යනාදිය ඇතුළත් අපගේ සේවාලාභීන් වෙත සේවය පිණිස අපි කැපවී සිටින්නෙමු. ස්වකීය අනාගත කාර්යභාරය වෙනුවෙන් මම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මාගේ සුභාසිංශන පිරිනමමි.

**පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ**

**රජයේ ප්‍රධාන තක්සේරුකරු**

**තක්සේරු දෙපාර්තමේන්තුව**

## හැඳින්වීම

මෙම කාර්ය සාධන හා ගිණුම්කරණ වාර්තාව, තක්සේරුකරණ හා මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදාගත් උපක්‍රම, සැලසුම් හා උපාය මාර්ග ද, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තක්සේරුකරණ හා මූල්‍ය පරිපාලන ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදා ගත් උපක්‍රම, සැලසුම් හා උපාය මාර්ග ද, මුදල් අමාත්‍යාංශය මගින් වූ අයවැය සම්පාදන හා අවසන් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යභාරය හා සම්පත් පරිශීලනය ද ගෙනහැර දැක්වෙන අවසන් වැඩ පියවරයි. 2017 වසර තුළ දෙපාර්තමේන්තුව මගින් ඉටු කළ කාර්ය භාරය සවිස්තරාත්මකව සාකච්ඡා කෙරෙන මෙම වාර්තාව පිළියෙළ කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුව සහ ඊට ගැළපෙන පරිදි වේ.

## මෙම වාර්තාව පරිශීලනය කරන ආකාරය

මෙම වාර්තාවෙන් විස්තර වන්නේ, රටේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා වන අපගේ මෙහෙවර ඉටු කිරීමෙහිලා සහය සලසා ගනු පිණිස අප විසින් සකසන ලද අපගේ වාර්ෂික කාර්ය සාධන සැලැස්මේ ඉලක්ක හා අරමුණු ඔස්සේ දෙපාර්මේන්තුවේ කාර්ය සාධන ක්‍රියාමාර්ගහා අපගේ ප්‍රගතිය එහි තථ්‍ය ප්‍රතිඵල සමග සංසන්දනය කරමින් සිදුකරනු ලබන කරුණු දැක්වීමකි. 2013-2017 දක්වා කාලය තුළදී අපගේ කාර්ය සාධනය වසරින් වසර විශ්ලේෂණය කෙරෙන මෙම වාර්තාව ප්‍රධාන කොටස් 04 කින් සමන්විත වේ.

**1** වන කොටස**: දෙපාර්තමේන්තුවේ කටයුතු**

මේ යටතේ අපගේ කාර්ය සාධනය පුළුල්ව දැක්වෙන සහ 2017 වසරේ සම්පත් පරිභණය පිළිබඳව වූ විස්තර අඩංගු වේ. ඊට අමතර වශයෙන්, අරමුණු සාර්ථක කර ගැනීමෙහිලා අප විසින් ඉවහල් කරගත් උපක්‍රම, කලමනාකරණ අභියෝග හා අපගේ කාර්ය සාධනයට බලපෑ බාහිර කරුණු මෙහි අන්තරගත කර ඇත**.**

**2** වන කොටස**: කාර්ය සාධන සහ විශ්ලේෂණය**

මෙහිදී 2017 වසරේ කාර්ය සාධනය අපගේ දිගු කාලීන ඉලක්කගත අරමුණු සහ 2018 වසරේ ඉලක්ක කර ගත් අරමුණු, ඒවා සාක්ෂාත් කර ගැනීමෙහිලා යොදාගත් උපාය මාර්ග, එය සපුරාගත් ආකාරය මෙන්ම සපුරා ගැනීමට නොහැකි වූ අරමුණු සහ ඊට හේතු පාදක වූ කරුණු ද විශ්ලේෂණය කරමින් මෙම ශීර්ෂය යටතේ සාකච්ඡාවට භාජනය කර ඇත**.**

**3** වන කොටස**: මූල්‍ය කාර්යකරණය හා විශ්ලේෂණය**

2017 වසරේ මූල්‍ය, ඒකාබද්ධ මූල්‍ය වාර්තා, මූල්‍ය ප්‍රකාශ හා සටහන් සහ ඊට අනුබද්ධ අතිරේක තොරතුරුයනාදිය සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශීලනය කරන්න.

**4** වන කොටස**: අනුමත සේවක සංඛ්‍යාව හා මානව සම්පත**

දෙපාර්තමේන්තුවේ මානව සම්පත පිළිබඳ ලුහුඬු විශ්ලේෂණයක් සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශීලනය කරන්න.

# 1 වන කොටස - දෙපාර්තමේන්තුවේ කටයුතු

## 1.1. *අප ගැන*

**“අපගේදැක්ම”**

“නිශ්චල දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයයෙහිලා ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීයමය සේවාවන් තුළින් සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම”

**“අපගේ මෙහෙවර”**

“කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ ව්‍යුහයක් තුළින් තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණිකව ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීයමය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීම.”

**අපගේ මූලික වගකීම්**

“තක්සේරු දෙපාර්තමේන්තුව, තම ව්‍යවස්ථාපිත වගකීම් හැරුණු විට, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන උදෙසා විස්තීර්ණ තක්සේරු සේවාවන් හා දේපළ කළමනාකරණ සේවාවන් *සැපයීමේ වගකීම උසුලයි.*”

**අපගේ අරමුණු**

“මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ සේවාදායකයින් වෙත ප්‍රතිඵල සාධනය ඉලක්ක කරගත් විශිෂ්ටතම කාර්ය චර්යා ප්‍රමිතීන් මත පිහිටා උසස් වෘත්තීයමය සේවාවන් සැපයීමයි.

## 1.2. *දෙපාර්තමේන්තුවේ මූලික ක්‍රියාදාමයන්*

දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

(අ) ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා අත්කර ගන්නා විට, එම පනත යටතේ ගෙවිය යුතු වන්දි හා තක්සේරු වාර්තා පිළියෙළ කරනු ලබන අතර, හදිසි අත්කර ගැනීමක දී මෙම පනතේ 38 (අ) වගන්තිය යටතේ තත්ත්ව වාර්තා පිළියෙළකිරීම ද සිදු කරනු ලැබේ.
තක්සේරු දෙපාර්තමේන්තුව, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සුවිශේෂී දැවැන්ත ව්‍යාපෘති වෙනුවෙන් මහා පරිමාණ තක්සේරු කිරීම් ඉටුකර දීම මගින් සුවිශාල මට්ටමේ පරිපූර්ණ වෘත්තීය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවයක් සැපයීමෙහි නියැලී සිටී.

(ආ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යථා කාලයේදී දේපළ අත්කරගැනීමේ අරමුණින් මුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු කටයුතු කරනු ලැබේ.

(ඇ) පුද්ගලික ගිවිසුම් මත දේපළ මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම, ගිණුම් කටයුතු මෙන්ම බදු කාර්යයන් උදෙසා සහ වෙනත් විවිධ කාරයයන් සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කරනු ලබයි.

(ඈ) රජයේ හා රාජ්‍ය ආයතනවල දේපළ කුලියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවල පරිහරණය සඳහා අවශ්‍ය වූ විට, ඒ සඳහා කුලී තක්සේරු සපයනු ලැබේ.

(ඊ) විශේෂයෙන් ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩය වැනි ආයතන වෙත වත්කම් තක්සේරුකරණය හා නිශ්චල දේපළ කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක සේවාවන් සැපයීම හා එම අංශයන්හි දැනුම වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය කටයුතු ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබේ.

(උ) වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර විසඳුම් ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂි සැපයීම මගින් සහය වන අතර දෙපාර්තමේන්තු නිලධාරීන්, ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවල (කොළඹ මහ නගරසභා සීමා බල ප්‍රදේශය තුළ හැර, අනෙකුත් ගෙවල් කුලී මණ්ඩලවල) රැස්වීම්වලට නිලලත් සාමාජිකයන් වශයෙන් සහභාගි වේ.

(ඌ) මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු සිදුකරනු ලැබේ.

(ඔ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි රාජ්‍ය දේපළවල වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරුකරුගේ අනුමැතිය සහිතව කොළඹ මහ නගර සභාව විසින් තක්සේරු කරනු ලැබේ.

(ඕ) රාජ්‍ය හා අර්ධරාජ්‍ය ආයතනවල ගිණුම්කරණ කාර්යයන් සඳහා වත්කම් තක්සේරු කිරීම.

## 1.3 *අභියෝග හා උපාය මාර්ග*

මෙම අංශය විෂයයෙහි ගෙනහැර දක්වනු ලබන අභියෝග හා උපාය මාර්ග, තක්සේරුකරණයේ ක්‍රම සහ මුල්‍ය වාර්තාකරණය යන කරුණු සම්බන්ධයෙන් වන්නාවූ අභ්‍යන්තර පාලනයේ කාර්යක්ෂමතාව පිළිබඳ තක්සේරුවක් සිදු කරන ලදී. එම ප්‍රයත්නය තුළින්, අදාළ දුර්වලතා පිටු දැක නිසි ගිණුම්කරණමය හා වාර්තාකරණමය කාර්ය සාධනයක් සහතික වනු පිණිස නිවැරදි හා කාර්යක්ෂම ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම තුළින් ඒවා වැඩිදියුණු කිරීමේ ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වා ගැනේ. සමාලෝචිත 2017 වසර මුළුල්ලේම තක්සේරු දෙපාර්තමේන්තුව ස්වකීය කාර්ය සාධන දත්ත අදාළ වසර තුළ ඉටුකරන ලද තක්සේරු කිරීම් මත පිහිටා විශ්ලේෂණයට හසු කිරීම මගින් ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව මැන බලන අතර දෙපාර්තමේන්තුවේ තක්සේරුකරණ කාර්ය සාධන ක්ෂේත්‍රය තුළ උද්ගත වන අඩුපාඩු හඳුනා ගනිමින් ඒවා පිටු දැකීම සඳහා අවශ්‍ය වන්නාවූ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හඳුනා ගැනීම පිණිස මෙම දත්ත උපයෝගී කර ගනියි.

අප විසින් සලසා දෙනු ලබන සේවය ප්‍රධාන වශයෙන් කළමනාකරණයේ ඵලදායිතා හා කාර්යක්ෂමතා මට්ටම කෙරෙහි අනුගතව පවතී. අපගේ හරයාත්මක නීතිමය බලසීමා සම්බන්ධයෙන් ප්‍රති අවධානය යොමු කෙරෙන විධිමත් ඇගයුම් උපාය මාර්ග සංවර්ධනය කරගැනීම පිණිස වූ අප ආයතනය සතු හැකියාව මීට හේතු කාරක වන්නේය. අපගේ ශක්තීන්,දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳව විශ්ලේෂණය කෙරෙන නිසි හා විධිමත් කාර්ය සාධන ඇගයුම් ක්‍රමවේදයක් නොමැති වීම අද දින ප්‍රමුඛ ගැටලුවක් බවට පත්ව තිබේ.

අපගේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමේ අරමුණ පෙරදැරිව අපගේ අභ්‍යන්තර හා බාහිර දක්ෂතා, අභියෝගතා, අවස්ථා හා තර්ජන අගැයුමට ලක්කිරීම මගින් අප ආයතනය සම්බන්ධයෙන් කරුණු මැන බැලීම ඉලක්ක කර ගත් සංවිධානමය කලමනාකරණ ක්‍රමවේදයක් පිළිබඳව සාපේක්ෂ වශයෙන් වූ අභිනව සංකල්පයක් අප විසින් උපයෝගී කරගනු ලැබිය යුතු වන්නේය. ප්‍රමුඛ වශයෙන්, වඩා ශක්තිමත් ක්ෂේත්‍ර

හා වැඩිමනත් අවස්ථා පවතින ක්ෂේත්‍ර වෙත අපගේ ක්‍රියාදාමය යොමු කිරීමට අපට පුළුවන. තක්සේරුකරණය හා දේපළ කළමනාකරණය යන ක්‍රියාදාම පරාසය තුළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට සේවා සලසන අද්විතීය රාජ්‍ය ආයතනයක් වන අප ඉදිරියේ පුළුල් වෙළඳපලක් ඒ සඳහා විවෘතව පවතී.

දෙපාර්තමේන්තුව තුළ ප්‍රමුඛ ස්ථානවල සුදුසු කාර්ය මණ්ඩල සේවයෙහි නිරතව සිටීම අප සතු මහඟු වත්කමකි. දෙපාර්තමේන්තුවේ තක්සේරු සේවක මණ්ඩලය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විශේෂ උපාධිධාරීන් වන අතර නව ප්‍රගුණතා අනුව කටයුතු කිරීම සඳහා සියලුම සේවක කාර්යමණ්ඩල අවශ්‍ය දැනුමෙන් හා නිපුණත්වයෙන් පරිපූර්ණව සිටිති. ඉතා ඉහළ වෘත්තීමය තත්වයක් ලඟාකරගැනීමට හැකි වනු පිණිස රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන නියෝග අනුව කටයුතු කරමින් ස්වකීය සේවා කාලය තුල අවශ්‍ය වන්නාවූ දැනුම හා ප්‍රවීණතාවය යාවත්කාලීන කරගනු සඳහා රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වය ලබා ගැනීම උදෙසා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කඩිනම් මාර්ගයක් අදාළ කාර්ය මණ්ඩල වෙත සලසා දී තිබේ. මෙම විශ්ව විද්‍යාල ආයතනයේම දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවනට හා සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවනට මෙම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අරමුදල් ද සපයා දී තිබේ. තක්සේරුකරණය පිළිබඳව ස්වකීය දැනුම යාවත්කාලීන කර ගනු පිණිස තක්සේරු කාර්ය මණ්ඩලය උදෙසා ධාරිතා වර්ධන වැඩසටහන්ද කලින් කලට පවත්වනු ලැබේ.

# 2 වන කොටස - කාර්යසාධනය සහ විශ්ලේෂණය

## 2.1 *අධ්‍යාපනික උන්නතිය*

**නිපුණතා සංවර්ධන කේන්ද්‍රය**

දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාවය තේමාකර ගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුළින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයත්, අභිප්‍රේරණය, කාර්ය සාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුළින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්මයත් සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී. තක්සේරු දෙපර්තමේන්තුව තුළ නිපුණතා සංවර්ධන කේන්ද්‍රය පිහිටුවා ඇත්තේ එහි සියලුම කාර්ය මණ්ඩලවල දැනුම වර්ධනය කිරීමේ පුළුල් පරමාර්ථයෙනි. මෙම නිපුණතා සංවර්ධන හා පුහුණු කේන්ද්‍රය තක්සේරු දෙපාර්තමේන්තුවේ ආරම්භයත් සමගම පුහුණු පාසලක් වශයෙන් බිහිවූ එකකි. පුහුණුව ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වීම නිසා ඊට අදාළ සංකල්ප වෙනස් කිරීම් වලට භාජනය කෙරුණු අතර මෙම පුහුණු පාසල නව ප්‍රවණතාවලට ප්‍රතිචාර දක්වන නවෝත්පාදක වැඩසටහන් ඉදිරිපත් කරන්නාවූ විද්‍යායතනයක් බවට පත්විය. පසුගිය වසර කීපය මුළුල්ලේ මෙම විද්‍යායතනය මූල්‍යමය වශයෙන් ලාභදායි හා ලාභදායි නොවන පුහුණු වැඩසටහන් ගණනාවක් දෙපාර්තම්න්තුවේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා වූ කළමනාකරණය වෙතද, බාහිර පාර්ශවයන් වෙතද දියත් කර හරිනු ලැබ තිබේ.

දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම ආකල්ප හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම තුළින් වෘත්තීය විශිෂ්ඨත්වය ළඟාකර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහයවීම සිදු කරයි.

නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන අංශ දෙකක් යටතේ පහත සඳහන් පරිදි වර්ගීකණය කළ හැකිය.

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන්
- බාහිර පුහුණු වැඩසටහන්

නිපුණතා සංවර්ධන කේන්ද්‍රය මගින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන් ඒවා අයත් විවිධ විෂය පථයන් අනුව තවදුරටත් වර්ගීකරණය කර ඇති අතර පහත සඳහන් පරිදි ගෙනහැර දැක්විය හැකිය.

**අ. අභ්‍යන්තර පුහුණු වැඩසටහන්** (අභ්‍යන්තර වෘත්තීය නිලධාරීන් සහ කළමනාකරණ සේවක පිරිස් සඳහා)

අ. රැකියා නැඹුරුවක් සහිත පුහුණු වැඩසටහන්

ආ. විෂය කේන්ද්‍රකොට ගත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු

ඉ. විභාග ඉලක්ක කොටගත් පුහුණු සැසි හා වැඩමුළු

ඊ. දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු

**ආ. බාහිර පුහුණු වැඩ සටහන්**

අ. පළාත් පාලන නිලධාරින් සඳහා පුහුණු සැසිවාර

ආ. පළාත් ආදායම් නිලධාරින් සඳහා පුහුණු සැසිවාර හා වැඩමුළු

ඇ. දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන් සඳහා වෘත්තීය අනුබද්ධ වැඩසටහන්

ඈ. අත්කර ගැනීමේ නිලධාරින් සඳහා වන වැඩමුළු හා පුහුණු සැසිවාර

ඉ. අවශ්‍යතා අනුව විශේෂයන් ම සැකසුනු පුහුණු වැඩසටහන්

## 2.2 *තක්සේරු කටයුතුවල කාර්ය සාධනය වාර්තා කිරීම, ප්‍රාග්ධන සහ කුලී තක්සේරු කිරීම*

**I.** ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ තක්සේරු කිරීම :

2017 වසරේදී දෙපාර්තමේන්තුව විසින් 1950 අංක 9 දරන ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ නිලධාරීන් විසින් 17 (1) වගන්තිය ප්‍රකාර කළ යුතු වන්දි ප්‍රදානයන් උදෙසා ඒකක 21280 ක තක්සේරු වාර්තා නිම කර ඇති අතර එම පනතේ 38 (අ) වගන්තිය මත රජයට පවරා දෙනු ලැබඇති ඉඩම් 11036 ක් උදෙසා තත්ත්ව වාර්තා පිළියෙළ කර ඇත.

**II.** අනිවාර්ය ඉඩම් අත්කර ගැනීම්වලට අදාළ දේපළ ඇස්තමේන්තු කිරීම :

1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට යෝජිත ඉඩම් අත්කර ගැනීම් කාර්යය වනුවෙන් මුදල් වෙන්කර ගැනීම සඳහා 2017 වසර තුළ දේපළ 1471 ක් ඇස්තම්න්තු කර ඇත.

**III.** රාජ්‍ය ආයතන හා රාජ්‍ය අංශයේ සංස්ථා සහ මණ්ඩල යනාදිය වෙනුවෙන් වත්කම් තක්සේරු කිරීම :

2017 වසර තුළ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, තිරසර බලශක්ති අමාත්‍යාංශය, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ තරුණ කටයුතු හා කුසලතා සංවර්ධන අමාත්‍යාංශය යන රජයේ හා රාජ්‍ය අංශයේ ආයතන සතු දේපළ 56931 ක් සඳහා වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකර දී ඇත.

**IV.** අල්ලස් පනත යටතේ තක්සේරු කිරීම :

2017 වසර තුළ දෙපාර්තමේන්තුව අල්ලස් පනත යටත් අල්ලස් කොමසාරිස් වෙත තක්සේරු වාර්තා හතක් සපයා ඇත.

**V.** මුද්දර බදු සඳහා තක්සේරු කිරීම :

මුද්දර බදු සම්බන්ධ කාර්යයන් පිණිස දේපළ දෙසිය හතලිස් අටක් සඳහා වූ තක්සේරු කටයුතු නිම කර ඇත.

**VI.** රජය සතු දේපළ සඳහා මාසික කුලී හා වෙනත් බදු කුලී තීරණය කිරීම :

ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ජේදයේ 5:1 සහ 7:1 යන වගන්ති යටතේ නියම කළ යුතු ආර්ථික කුලී හා දණ්ඩන කුලී අයකිරීම් උදෙසා කුලී තක්සේරු වාර්තා 4230 ක් 2017 වසර තුළ වාර්තා කොට ඇත

**VII.** **කුලී තක්සේරු කිරීම :**


2017 වසර තුළ විවිධ රාජ්‍ය ආයතනවල පරිහරණය සඳහා වූ දේපළ 11149 ක් සම්බන්ධයෙන් කුලී වර්තා පිළියෙළ කර ඇත.

සමාලෝචිත වසර තුළ දෙපාර්තමේන්තු නිලධාරින් ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් දිවයින පුරා පැවති ගෙවල් කුලී මණ්ඩල රැස්වීම් වාර හයසිය පනස් අටක් සඳහා සහභාගි වී ඇත.

## 2.3. *නිම කළ තක්සේරු වාර්තා (වර්ෂමය හා ඉලක්කගත)*

**නිම කළ සාමාන්‍ය තක්සේරු වාර්තා (වර්ෂමය හා ඉලක්කගත)**


| තක්සේරු වර්ගය | **2013** | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
|---|---|---|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 13818 | 22877 | 8092 | 23389 | 11036 | 8090 |
| ඉඩම් අත්කර ගැනීම් | 9320 | 16476 | 15639 | 20045 | 21280 | 19398 |
| ඉඩම් ඇස්තමේන්තු | 1423 | 1243 | 648 | 1032 | 1471 | 808 |
| ඉඩම් විවිධ | 58563 | 48174 | 33222 | 41987 | 56931 | 23099 |
| කුලී පුද්ගලික | 6851 | 6067 | 7619 | 8912 | 11149 | 9780 |
| කුලී රජය | 5159 | 4521 | 4094 | 4132 | 4230 | 3389 |




* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත

## 2.4. *සාමාන්‍ය තක්සේරු වාර්තා* (*ඉලක්කගත - නිමකළ - ප්‍රක්ෂේපිත*)

| | 2017 ඉලක්කගත | 2017 නිමකළ | 2018 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 20000 | 11036 | 8090 |
| ඉඩම් අත්කර ගැනීම් | 31500 | 21280 | 19398 |
| ඉඩම් ඇස්තමේන්තු | 600 | 1471 | 808 |
| ඉඩම් විවිධ | 30000 | 56931 | 23099 |
| කුලී පුද්ගලික | 8000 | 11149 | 9780 |
| කුලී රජය | 4000 | 4230 | 3389 |




* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත.

## 2.5 *වරිපනම් හා වරිපනම් ආශ්‍රිත තක්සේරු*

පළාත් පාලන ආයතන, එනම් මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා සඳහා වරිපනම් බදු සහ ඊට අදාළ පශ්චාත් තක්සේරු ගාස්තු අය කිරීම සඳහා 2017 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කළ වරිපනම් තක්සේරු හා පශ්චාත් වරිපනම් තක්සේරු සැලකිය යුතු විශාල ප්‍රමාණයක් වූ අතර එහි සාරාංශයක් පහත දැක්වේ.

### 2.5.1 වරිපනම් තක්සේරු

2017 වසර තුළ දී  දේපළ 183632 කට අයත් මූලික සමීක්ෂණ ද, 194527 ක් වූ අවසන් සමීක්ෂණ ද, විශේෂ දේපළවලට අයත් 1093 ක් වූ  සමීක්ෂණ ද නිම කරමින් ප්‍රාදේශික බදු අය කිරීම සඳහා වූ මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යටතේ ගැනෙන සැලකිය යුතු ප්‍රමාණයක දේපළවල තක්සේරු කිරීම් සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය.


### 2.5.2 වරිපනම් ආශ්‍රිත තක්සේරු කටයුතු

2017 වසර තුළ දී 28802 ක් වූ ඉඩම් ප්‍රමාණයක්  තක්සේරු කිරීමේ කටයුතු ද, 1832 ක් වූ ගොඩනැගිලි ප්‍රමාණයක් තක්සේරු කිරීමේ කටයුතු ද,4902 ක් වූ  තක්සේරු විරෝධතා සම්බන්ධ කටයුතු ද නිම කිරීමට දෙපාර්තම්න්තුවට හැකි විය.

## 2.6. *වරිපනම් ප්‍රතිශෝධන කටයුතු - වසරමය සහ ප්‍රක්ෂේපිත*

**වරිපනම් තක්සේරු කටයුතු - වසරමය සහ ප්‍රක්ෂේපිත**

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 243390 | 184675 | 119539 | 173619 | 183632 | 381641 |
| අවසන් සමීක්ෂණ | 203702 | 180548 | 150455 | 166155 | 194527 | 355641 |




## 2.7. *වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය*

**2017 ඉලක්කගත < 2017 නිමකළ > 2018 ප්‍රක්ෂේපිත**

**වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය 2017–2017 ඉලක්කගත < 2017 නිමකළ > 2018 ප්‍රක්ෂේපිත**

| | **2017 ඉලක්කගත** | **2017 නිමකළ** | **2018 ප්‍රක්ෂේපිත** |
|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 400000 | 183632 | 381641 |
| අවසන් පරීක්ෂා කිරීම | 400000 | 194527 | 355641 |

**වරිපනම් තක්සේරු - 2017 ඉලක්කගත <2017 නිමකළ> 2018**




## 2.8. *වරිපනම් ආශ්‍රිත තක්සේරු කටයුතු*

**වරිපනම් තක්සේරු කටයුතු ගිණුම**


| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන | 31133 | 26290 | 25919 | 28769 | 28802 | 27312 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ගොඩනැගිලි | 1676 | 2227 | 1499 | 1680 | 1832 | 1967 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන විරෝධතා | 10665 | 8451 | 5149 | 2512 | 4902 | 5305 |

**වරිපනම් තක්සේරු කටයුතු ගිණුම (2013-2018)**



## 2.9. *වරිපනම් තක්සේරු කටයුතු - ඉලක්කගත < නිමකළ > ප්‍රක්ෂේපිත*

| | 2017 ඉලක්කගත | 2017 නිමකළ | 2018 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ඉඩම් | 28000 | 28802 | 27312 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ගොඩනැගිලි | 2000 | 1832 | 1967 |
| වරිපනම් තක්සේරු විරෝධතා | 8000 | 4902 | 5305 |



## 2.10 *ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය*


දෙපාර්තමේන්තුවේ නීති අංශයේ කාර්යය වන්නේ, 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ස්ථාපිත ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත, දේපළ අත් කර ගැනීම යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවූ අගතියට පත් පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් එකී සමාලෝචන මණ්ඩලයට සහය වීමයි.

### 2.10.1 කාර්ය සාධනය - ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලයේ

**පරිපාලනමය තත්ත්වය පිළිබඳ ගිණුම - ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලය**

**(31.07.2017 සිට )**


| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| වසර මුල ඉතිරිය | 2088 | 978 | 2216 | 178 | 179 |
| වසර තුළ ලද සංඛ්‍යාව | 245 | 429 | 558 | 215 | 92 |




* වසර මුල ඉතිරිය * වසර තුළ ලද සංඛ්‍යාව

2.10.2 ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් නිම කරන ලද අභියාචනා සාරාංශය


| | **2013** | **2014** | **2015** | **2016** | **2017** |
|---|---|---|---|---|---|
| වසර මුල ඉතිරිය | 2088 | 978 | 2216 | 178 | 179 |
| වසර තුළ ලද සංඛ්‍යාව | 245 | 429 | 558 | 215 | 92 |
| **කටයුතු කළ මුළු එකතුව** | **1486** | **2333** | 1407 | **393** | **271** |




*වසර මුල ඉතිරිය * වසර තුළ ලද සංඛ්‍යාව

### 2.10.3 ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් කටයුතු කළ අභියාචනා සාරාංශය

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| අසා නිම කළ | 279 | 256 | 282 | 214 | 3 |
| මූලික විභාගයෙන් පසුව අවසන් කළ | 61 | 18 | 19 | 107 | 7 |
| ඉල්ලා අස්කරගත් අභියාචනා | 52 | 52 | 89 | 75 | 17 |
| සමථයට පත්කළ | 81 | 114 | 176 | 0 | 39 |
| ප්‍රතික්ෂේපිත අභියාචනා | 85 | 115 | 282 | 32 | 12 |



## 2.11. *රාජ්‍ය වත්කම් තක්සේරු කිරීම* 2017

රජයේ අයිතිය යටතේ පවත්නා සියලුම නිශ්චල දේපළ තක්සේරු කිරීමේ කාර්ය භාරය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පවරා දෙනු ලැබ ඇති අතර එම ක්‍රියාදාමය ඒ සඳහාම ස්ථාපනය කළ රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ ඒකකය මගින් කඩිනම් ව්‍යාපෘතියක් ලෙස අතිරේක කාර්ය මණ්ඩල ද බඳවා ගනිමින් ඔවුන්ගේද සහය ඇතිව ඉටු කරනු ලැබේ. ගත වූ 2012 සහ 2017 අතර කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශ 77 කට අයත් මුළු දේපළ ඒකක 6608 කට අදාළ වත්කම් තක්සේරු කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද අතර 2017 වසර වන විට අමාත්‍යාංශ 55 කට අයත් දේපළ ඒකක 1000 කට වැඩි ගණනාවක් තක්සේරු කටයුතු සාර්ථක ලෙස නිම කර ඊට අදාළ වාර්තා ද සපයා දෙනු ලැබ ඇත.

## 2.12 *විශේෂ ව්‍යාපෘති*

### තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2017 වසර තුළ ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘතිවල සාරාංශය

මෑත වර්ෂ කීපය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සන්දර්භය තුළ සිදුවූ වෙනස්කම් බොහෝය. රාජ්‍ය ප්‍රතිපත්ති වලට හා ආර්ථික ප්‍රතිසංස්කරණ වලට අනුගත වෙමින් රටේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා රජය විසින් විවිධ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. එම සංවර්ධන ක්‍රියාවලිය බාධා විරහිතව ක්‍රියාවට නැංවීම පිණිස ශ්‍රී ලංකා රජය වෙත පරිපූර්ණ අධි වෘත්තීයමය තක්සේරුකරණ හා දේපළ කළමනාකරණ සේවා මහ පරිමාණ වශයෙන් සලසා දීම අරබයා තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් අතර දිවයින පුරා විවිධ විශේෂ අංශ ආශ්‍රිතව බිහිවූ ව්‍යාපාරික හා තාක්ෂණමය සංවර්ධන ප්‍රදේශ, ජාතික ආර්ථිකය හා ජාතික ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා වූ මහා මාර්ග ව්‍යාපෘති මෙන්ම සංචාරක කලාපවල සිදුකරන ලද සංවර්ධන කටයුතු ද වූයේය. තක්සේරු දෙපාර්තමේන්තුව මෙම විශේෂ ව්‍යාපෘතිවලට අයත් සියලුම ඉඩම් කැබලි හා සම්බන්ධ ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලට සහභාගිවූ අතර එම දේපළවල තක්සේරු කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබ ඇත. ඉඩම් අත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලදී පැන නැගි ආරවුල් සහිත දේපළ ගැටලු නිරාකරණය සඳහා වූ විශේෂ රැස්වීම් වලටද දෙපාර්තමේන්තුව සහභාගි විය. 2016 වසර තුළ තක්සේරු දෙපාර්තමේන්තුව මෙබඳු විශේෂ රැස්වීම් 391 ක් සඳහා සහභාගි වී අදාළ දේපළ ගැටලු නිරාකරණයෙහිලා සහය විය.

`

## 2.12.1 2017 වසර තුළ නියැලි විශේෂ ව්‍යාපෘති

| අංකය | වගකිව යුතු ප්‍රාදේශීය නිලධාරීන් | ව්‍යාපෘති |
|---|---|---|
| 1 | මහනගර | නව කැළණි පාලම ඉදි කිරීම් ව්‍යාපෘතිය |
| | | ඔරුගොඩවත්ත –අඹතලේ මාර්ගය |
| | | කොළඹ - හොරණ මාර්ගය |
| | | කිරුළපන ගොඩගම මාර්ගය |
| | | වේරුස් ගඟ සංවර්ධන ව්‍යාපෘතිය |
| | | ශාන්ත සෙබස්තියන් උතුරු ඇල මාර්ග ව්‍යාපෘතිය |
| | | කොම්පඤ්ඤවීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය |
| | | මට්ටක්කුලිය පාලම සංවර්ධන ව්‍යාපෘතිය |
| | | රාජගිරිය ගුවන් පාලම් ව්‍යාපෘතිය |
| | | මැරයින් ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය |
| | | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග ව්‍යාපෘතිය |
| | | ශ්‍රී ජයවර්ධනපුර කොල්ලුපිටිය මාර්ගය |
| | | නාරාහේන්පිට නුගේගොඩ පාලම |
| | | දෙහිවල - අත්තිඩිය මාර්ගය |
| | | වටරප්පල මාර්ගය |
| 2 | බටහිර මධ්‍යම | වේරුස් ගඟ ව්‍යාපෘතිය |
| | | කොට්ටාව - තලගල මාර්ගය |
| | | කිරුළපන ගොඩගම මාර්ගය |
| | | කෝට්ටේ - බෝපේ මාර්ගය |
| | | වල්ගම - දියගම මාර්ගය (ඔපෙක් 2 ව්‍යාපෘතිය ) |
| | | 6/1 පාලම (කොට්ටාව) |
| | | කොට්ටාව - පින්හේන මාර්ගය |
| | | කොට්ටාව - පන්නිපිටිය මාර්ගය |
| | | තලගල - මොරගහහේන මාර්ගය |
| | | සොයිසා මාර්ගය |
| | | රොබට් ගුණවර්ධන මාවත |
| | | කඩුවෙල - අතුරුගිරිය මාර්ගය |
| | | වල්ගම- අතුරුගිරිය මාර්ගය(ඔපෙක් 3 ව්‍යාපෘතිය) |
| | | පාර්ලිමේන්තු ගංඉවුර |

| | | |
|---|---|---|
| | | පැලවත්ත - අකුරෙගොඩ මාර්ගය |
| 3 | බටහිර උතුර | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය |
| 4 | බටහිර දකුණ | හොරණ - අඟුරුවාතොට - අලුත්ගම මාර්ගය |
| | | පොකුණුවිට - කෝරළඉම මාර්ගය |
| | | කළුවැල්ල - බැල්ලපිටිය මාර්ගය |
| 5 | දකුණ | මාතර - හක්මන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | මොරගොඩ |
| | | දක්ෂිණ අධිවේගී මාර්ගය |
| | | ගාල්ල බද්දේගම මාර්ගය |
| | | හම්බන්තොට ගන්නෝරුව මාර්ගය |
| | | මිර්ජ්ජවිල සූරියවැව මාර්ග ව්‍යාපෘතිය |
| | | වලස්මුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| | | වීරකැටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 6 | මධ්‍යම - I | මධ්‍යම අධිවේගී මාර්ගය |
| | | A9 මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | විලියම් ගොපල්ලව මාවත |
| | | පේරාදෙනිය බදුල්ල චෙන්කලඩි මාර්ගය |
| | | මහනුවර - කිරිමැටිය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | පේරාදෙනිය හල්ලොලුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය |
| 7 | මධ්‍යම - II | මොරගහකන්ද සහකළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය |
| | | වයඹ පළාත් ගංගා ව්‍යාපෘතිය |
| | | මහනුවර යාපනය මාර්ගය |
| | | තලගොඩපිටිය - දොඹවෙල මාර්ගය |
| | | රත්තොට - ඉලුක්කුඹුර මාර්ගය |
| 8 | උතුරු මැද | මැදිරිගිරිය - කන්තලේ මාර්ගය |
| | | මැදිරිගිරිය ජාත්‍යන්තර ක්‍රීඩාංගණය |
| 9 | වයඹ | මධ්‍යම අධිවේගී මාර්ගය(II,III,IVකොටස්) |
| | | දැදුරු ඔය ජල විදුලි ව්‍යාපෘතිය |
| | | අඹයපුස්ස - කුරුණෑගල - දඹුල්ල ත්‍රිකුණාමලය මාර්ග ව්‍යාපෘතිය |
| 10 | සබරගමුව | මධ්‍යම අධිවේගී මාර්ගය |
| | | ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ගය |
| | | දැරණියගල - දෙහිඕවිට මාර්ගය |
| | | රත්නපුර ඉදිරිපිට මාර්ගය |

| | | |
|---|---|---|
| | | මහවැලි අධිකාරියේ ඉඩම |
| 11 | ඌව | ලුණුගම්වෙහෙර බෙහෙරලියා ඇල කතරගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | බදුල්ල - චෙන්කලඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| | | මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය |
| | | බදුල්ල - හාලිඇල - ඇල්ල ජල විදුලි ව්‍යාපෘතිය |
| | | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| 12 | උතුර | AB31 මාර්ගය |
| | | වවුනියා ජල සම්පාදන රක්ෂිත ව්‍යාපෘතිය |
| 13 | නැගෙනහිර | කින්නියා තඹලගමුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය |
| | | පේරාදෙනිය- චෙන්කලඩි මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | රඹුක්කන් ඔය ජල විදුලි ව්‍යාපෘතිය |

`

## 2.12.2 2018 වර්ෂය සඳහා පුරෝකථනය කළ විශේෂ ව්‍යාපෘති

| අංකය | වගකිව යුතු ප්‍රාදේශීය නිලධාරීන් | ව්‍යාපෘති |
|---|---|---|
| 1 | මහනගර | නව කැළණි පාලම ඉදි කිරීම් ව්‍යාපෘතිය |
| | | ඔරුගොඩවත්ත –අඹතලේ මාර්ගය |
| | | කොළඹ - හොරණ මාර්ගය |
| | | කිරුළපන ගොඩගම මාර්ගය |
| | | වේරැස් ගඟ සංවර්ධන ව්‍යාපෘතිය |
| | | ශාන්තසෙබස්තියන් උතුරු ඇල මාර්ග ව්‍යාපෘතිය |
| | | කොම්පඤ්ඤවීදිය ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය |
| | | මට්ටක්කුලිය පාලම සංවර්ධන ව්‍යාපෘතිය |
| | | රාජගිරිය ගුවන් පාලම් ව්‍යාපෘතිය |
| | | මැරයින් ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය |
| | | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග ව්‍යාපෘතිය |
| | | ශ්‍රී ජයවර්ධනපුර කොල්ලුපිටිය මාර්ගය |
| | | නාරහේන්පිට නුගේගොඩ පාලම |
| | | දෙහිවල - අත්තිඩියමාර්ගය |
| | | වටරප්පල මාර්ගය |
| | | නව කැළණි පාලම සිට රාජගිරිය දක්වා ගුවන් පාලම් අධිවේගී මාර්ගය |
| 2 | බටහිරමධ්‍යම | වේරැස් ගඟ ව්‍යාපෘතිය |
| | | කොට්ටාව - තලගල මාර්ගය |
| | | කිරුළපන ගොඩගම මාර්ගය |
| | | කෝට්ටේ - බෝපේ මාර්ගය |
| | | වල්ගම - දියගම මාර්ගය (ඔපෙක් 2 ව්‍යාපෘතිය) |
| | | 6/1 පාලම (කොට්ටාව) |
| | | කොට්ටාව - පින්හේන මාර්ගය |
| | | කොට්ටාව - පන්නිපිටිය මාර්ගය |
| | | තලගල - මොරගහහේන මාර්ගය |
| | | සොයිසා මාර්ගය |
| | | රොබට්ගුණවර්ධන මාවත |
| | | කඩුවෙල - අතුරුගිරිය මාර්ගය |
| | | වල්ගම - අතුරුගිරිය මාර්ගය (ඔපෙක් 3 ව්‍යාපෘතිය) |
| | | පාර්ලිමේන්තු ගං ඉවුර |
| | | පැලවත්ත - අකුරෙගොඩ මාර්ගය |
| | | පිළියන්දල - මහරගම මාර්ගය (ඔපෙක් 2 ව්‍යාපෘතිය) |
| | | මාකුඹුර - මාහේනවත්ත නව යෝජිත ව්‍යාපෘතිය |

| | | |
|---|---|---|
| | | කැළණිමුල්ල - කොස්වත්ත මාර්ගය |
| 3 | බටහිර උතුර | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය |
| | | කැළණිය - මුදුන්ගොඩ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| 4 | බටහිර දකුණ | හොරණ - අඟුරුවාතොට - අලුත්ගම මාර්ගය |
| | | පොකුණුවිට - කෝරළඉම මාර්ගය |
| | | කළුවැල්ල - බැල්ලපිටිය මාර්ගය |
| | | වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය |
| | | කොට්ටාව - තලගල මාර්ගය |
| | | බෙල්ලන - මොරගල මාර්ගය |
| | | රුවන්පුර අධිවේගී මාර්ගය |
| 5 | දකුණ | මාතර - හක්මන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | මොරගොඩ ඇල |
| | | දක්ෂිණ අධිවේගී මාර්ගය |
| | | ගාල්ල බද්දේගම මාර්ගය |
| | | හම්බන්තොට ගොන්නොරුව මීගහජඳුර මාර්ගය |
| | | මිරිජ්ජවිල සූරියවැව මාර්ග ව්‍යාපෘතිය |
| | | වලස්මුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| | | වීරකැටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| | | තිහගොඩ -කඹුරුපිටිය / මාවරල - කොටපොළ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| 6 | මධ්‍යම - I | මධ්‍යම අධිවේගී මාර්ගය |
| | | A9 මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | විලියම් ගොපල්ලව මාවත |
| | | පේරාදෙනිය බදුල්ල චෙන්කලඩි මාර්ගය |
| | | මහනුවර - කිරිමැටිය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | පේරාදෙනිය හල්ලොලුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය |
| | | මීපේ ඇල වම් ඉවුර පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය |
| 7 | මධ්‍යම - II | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය |
| | | වයඹ පළාත් ගංගා ව්‍යාපෘතිය |
| | | මහනුවර යාපනය මාර්ගය |
| | | තලගොඩපිටිය - දොඹවෙල මාර්ගය |
| | | රත්තොට - ඉලුක්කුඹුර මාර්ගය |
| | | මධ්‍යම අධිවේගී මාර්ගය |
| | | නකල්ස් සංරක්ෂණ ව්‍යාපෘතිය |
| 8 | උතුරු මැද | මැදිරිගිරිය - කන්තලේ මාර්ගය |

| | | |
|---|---|---|
| | | මැදිරිගිරිය ජාත්‍යන්තර ක්‍රීඩාංගණය |
| | | මල්වතු ඔය ව්‍යාපෘතිය |
| | | යාන් ඔය ව්‍යාපෘතිය |
| | | මරදන්කඩවල මඩකළපුව මාර්ගය |
| | | පොළොන්නරුව නවනගරය |
| | | පොළොන්නරුව වටරවුම |
| | | කදුරුවෙල නව වෙළඳ මධ්‍යස්ථානය |
| 9 | වයඹ | මධ්‍යම අධිවේගී මාර්ගය(II,III,IVකොටස්) |
| | | දැදුරු ඔය ජල විදුලි ව්‍යාපෘතිය |
| | | අඹේපුස්ස - කුරුණෑගල - දඹුල්ල ත්‍රිකුණාමලය මාර්ග ව්‍යාපෘතිය |
| | | වයඹ ගංගා ව්‍යාපෘතිය |
| | | දඹුල්ල දුම්රිය ස්ථාන මාර්ගය |
| 10 | සබරගමුව | මධ්‍යම අධිවේගී මාර්ගය |
| | | ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ගය |
| | | දැරණියගල - දෙහිඕවිට මාර්ගය |
| | | රත්නපුර ඉදිරිපිට මාර්ගය |
| | | මහවැලි අධිකාරියේ ඉඩම |
| | | රුවන්පුර අධිවේගී මාර්ගය |
| 11 | ඌව | ලුණුගම්වෙහෙර බෙහෙරලිය ඇල කතරගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | බදුල්ල - චෙන්කලඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| | | මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය |
| | | බදුල්ල - හාලිඇල - ඇල්ල ජල විදුලි ව්‍යාපෘතිය |
| | | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| | | බදුල්ල - ස්ප්‍රිංවැලි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| 12 | උතුර | AB31 මාර්ගය |
| | | කරෙයිනගර් - යාපනය මාර්ගය |
| | | වවුනියා ජල සම්පාදන රක්ෂිත ව්‍යාපෘතිය |
| 13 | නැගෙනහිර | කින්නියා තඹලගමුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය |
| | | පේරාදෙනිය- චෙන්කලඩි මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | රඹුක්කන් ඔය ජල විදුලි ව්‍යාපෘතිය |

## *2.13* 2018 වර්ෂය සඳහා වරිපනම් තක්සේරු පුරෝකථනය

| අංකය | වගකිව යුතු ප්‍රාදේශීය නිලධාරීන් | පළාත්පාලනආයතනය | දේපළ ගණන |
|---|---|---|---|
| 1 | මහනගර | - | - |
| 2 | බටහිරමධ්‍යම | බොරලැස්ගමුව | 30000 |
| | | හෝමාගම | 80000 |
| | | මහරගම | 90000 |
| | | මොරටුව | 62000 |
| | | කඩුවෙල | 30000 |
| 3 | බටහිර උතුර | - | - |
| 4 | බටහිර දකුණ | බේරුවල | 11800 |
| | | කළුතර | 14018 |
| | | පානදුර | 14750 |
| | | වලල්ලාවිට ප්‍රාදේශීය සභාව | 2405 |
| 5 | දකුණ | තිහගොඩ | 1850 |
| | | මාලිම්බඩ | 683 |
| | | අකුරැස්ස | 4000 |
| | | කිරින්ද පුහුල්වැල්ල | 1035 |
| | | කොටපොල | 1796 |
| | | මාතර මහ නගර සභාව | 33750 |
| | | දෙවිනුවර | 8000 |
| 6 | මධ්‍යම- I | අකුරණ | 11000 |
| | | පාතදුම්බර | 12000 |
| | | මැදදුම්බර | 3500 |
| | | මහනුවර | 60000 |
| | | කඩුගන්නාව | 8000 |
| | | යටිනුවර | 15500 |
| | | කඩවත්සතර ගඟවටකෝරළේ | 20000 |
| | | නාවලපිටිය | 5100 |
| | | ගම්පල | 17000 |

| | | | |
|---|---|---|---|
| | | පස්බාගේ කෝරළේ | 3200 |
| | | උඩපළාත | 7500 |
| | | ගඟවෙහෙර කෝරළේ | 5000 |
| 7 | මධ්‍යම- II | දඹුල්ල | 2772 |
| | | මාතලේ | 17000 |
| | | ගලේවෙල | 1057 |
| 8 | උතුරු මැද | - | - |
| 9 | වයඹ | හලාවත | 9900 |
| | | ආණමඩුව ප්‍රාදේශීය සභාව | 2525 |
| | | හලාවත ප්‍රාදේශීය සභාව | 4872 |
| | | කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව | 705 |
| | | කුලියාපිටිය | 5570 |
| | | කුරුණෑගල ප්‍රාදේශීය සභාව | 6620 |
| | | කුලියාපිටිය ප්‍රාදේශීය සභාව | 1841 |
| | | නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව | 22029 |
| | | පුත්තලම ප්‍රාදේශීය සභාව | 12511 |
| | | වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව | 758 |
| 10 | සබරගමුව | බලන්ගොඩ | 11000 |
| | | ගොඩකවෙලප්‍රාදේශීය සභාව | 3000 |
| 11 | ඌව | බණ්ඩාරවෙල | 18000 |
| | | හපුතලේ | 1600 |
| 12 | | යාපනය මහ නගර සභාව | 40000 |
| | | චාවකච්චේරි නගර සභාව | 40000 |
| | | චාවකච්චේරිඋපකාර්යාලය | 3000 |
| | | කයිතඩිඋප කාර්යාලය | 6500 |
| | | කච්චායිඋප කාර්යාලය | 3000 |
| | | මිරුසුවිල් උප කාර්යාලය | 3000 |
| | | නාවට්කුලි උපකාර්යාලය | 4000 |
| | | වරනායි උපකාර්යාලය | 3000 |

| | | | |
|---|---|---|---|
| | උතුර | ඩෙල්ෆ්ට් උපකාර්යාලය | 2500 |
| | | අනලතිවු උපකාර්යාලය | 1500 |
| | | ඉලුවාඉතිවු උපකාර්යාලය | 1500 |
| | | කයිට්ස් උපකාර්යාලය | 4500 |
| | | නරන්තායි උපකාර්යාලය | 1500 |
| | | මුරුදන්කර්නි උපකාර්යාලය | 1000 |
| | | පුලෝලි උපකාර්යාලය | 6500 |
| | | කඩ්ඩායිවෙලි උපකාර්යාලය | 5000 |
| | | නෙල්ලඩි උපකාර්යාලය | 8000 |
| | | උඩුප්පිඩි උපකාර්යාලය | 9000 |
| | | කෝපායි උපකාර්යාලය | 14000 |
| | | නේර්වෙලි උපකාර්යාලය | 7000 |
| | | පුතූර් උපකාර්යාලය | 6500 |
| | | කන්කසන්තුරෙයි උපකාර්යාලය | 4397 |
| | | මල්ලාහම් උපකාර්යාලය | 6500 |
| | | මල්ලිඩි උපකාර්යාලය | 10838 |
| | | තිලිප්පලර් උපකාර්යාලය | 7500 |
| | | මනිපායිනගර උපකාර්යාලය | 4000 |
| | | පණ්ඩිතෙරිප්පුග්‍රාම උපකාර්යාලය | 7000 |
| | | අලිප්පිඩිසහමාන්කුම්පන් උපකාර්යාලය | 1500 |
| | | මණ්ඩල්තීවු උපකාර්යාලය | 1500 |
| | | නලන්තීවු උපකාර්යාලය | 1500 |
| | | පුන්කුඩුතීවු උපකාර්යාලය | 1500 |
| | | වෙලනාල් උපකාර්යාලය | 6500 |
| 13 | නැගෙනහිර | අම්පාර | 10091 |
| | | මඩකළපුව | 15000 |
| | | ත්‍රිකුණාමලය | 15500 |

## 2.14 පුහුණු පහසුකම් හා අනුග්‍රාහිත පුහුණු වැඩසටහන් - 2017

### 2.14.1 වෙනත් ආයතනවල අවශ්‍යතා අනුව විශේෂයෙන් සැකසුන පුහුණු වැඩසටහන්

**දේපළ කලමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ තෙවන වසර විද්‍යාවේදී උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන**

මූලික ක්ෂේත්‍ර පරීක්ෂණය ආරම්භ කිරීමේ සිට තක්සේරු වාර්තාව පිළියෙළ කිරීම දක්වා වන න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලිය ආවරණය වන පරිදි දින 10 ක කාලයක් තුළ පැවැති අදාළ අවශ්‍යතාව සඳහාම සැකසුණු වැඩ සටහනක් උපාධි අපේක්ෂකයින් 66 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2017 වසර තුළ පැවැත්විණි.

### 2.14.2 අභ්‍යන්තර නිලධාරින් සඳහා වු පුහුණු වැඩසටහන්

**පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූපුහුණු වැඩසටහන**

පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳව  එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

**තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලුම තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩ සටහන**

තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලුම තක්සේරුකරුවන් සඳහා එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

**පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන**

පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා ‘‘විශිෂ්ට ජීවන විකුම් පදනම් කඳවුර’’ යන මැයෙන් නායකත්වය පිළිබඳ දැනුම දියුණු කිරීම පිණිස වූ එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

**පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූපුහුණු වැඩසටහන**

සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා ආකල්ප සංවර්ධනය පිළිබඳව එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

### 2.14.3 විභාග ඉලක්කගත පුහුණු වැඩසටහන්

**සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ඉලක්කගත පුහුණු වැඩසටහන**

තක්සේරු සේවයේ II පන්තිය II ශ්‍රේණිය සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා නියමිත ඔවුන්ගේ I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන් අදාළ නිලධාරින් පෙර සූදානම් කිරීමක් වශයෙන් සය දිනක් පුරා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම, වරිපනම් තක්සේරු, පරිපාලනය හා මූල්‍ය, ප්‍රාග්ධන තක්සේරුකරණය, දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා පරිපාලනය හා විශේෂ කාර්යයක් සඳහා යම් දේපළක් වෙනුවෙන් සවිස්තරාත්මක තක්සේරු වාර්තා පිළියෙළ කිරීම යන විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙමින් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක විය.

**දිස්ත්‍රික් තක්සේරුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ඉලක්කගත පුහුණු වැඩසටහන**

තක්සේරු සේවයේI පන්තියII ශ්‍රේණිය දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා නියමිත ඔවුන්ගේ I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග වෙනුවෙන් අදාළ නිලධාරින් පෙර සූදානම් කිරීමක් වශයෙන් උසස් තක්සේරුකරණය හා ඉඩම් අත්පත් කර ගැනීම යන විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක විය.

## 2.14.4 තක්සේරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිලධාරින් සඳහා වූ බාහිර පුහුණු වැඩසටහන්

**දේපළ කළමණාකරනය පිළිබඳ විද්‍යාපති උපාධිය**

එක්සත් රාජධානියේ රෙඩින් විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් පස් දෙනෙකු සහභාගි කරවීම පිණිස අරමුදල් ලදී.

**විදේශ පුහුණු වැඩසටහන**

රාජ්‍ය අංශයේ ජාත්‍යන්තර විගණකවරුන් සඳහා වූ කළමනාකරණ විගණනය පිළිබඳ ජාත්‍යන්තර වැඩ සටහන 2017 දෙසැම්බර් මස 16 වන දින සිට 2018 ජනවාරි මස 23 වන දින දක්වා පැවැත්විණි.

**විශේෂ දේපළ තක්සේරුකරණය පිළිබඳ ජාත්‍යන්තර සහතිකපත් පාඨමාලාව**

ඉහත පුහුණු වැඩ සටහන සඳහා දිස්ත්‍රික් තක්සේරුකරු සහ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු යන නිලධරයන් දෙදෙනෙකු සහභාගි කරවන ලදී.

**රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව**

දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුවකු සහ දිස්ත්‍රික් තක්සේරුකරුවකු ඉහත වැඩ සටහන සඳහා සහභාගි කරවන ලදී.

**තොරතුරු තාක්ෂණ නිලධාරින් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන**

ඉහත පාඨමලාව සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු සහ අතිරේක ප්‍රධාන තක්සේරුකරු යන නිලධරයන් සහභාගි කරවන ලදී.

**තොරතුරු තාක්ෂණ නිෂ්පාදන (SDFL) ප්‍රසම්පාදනය සහ අගැයුම්කරණය පිළිබඳ වැඩමුළුව**

ඉහත පාඨමලාව දෙපාර්තමේන්තුවේ එක් නිලධරයෙකු සහභාගි කරවිය.

**මූල්‍ය අධ්‍යයන විද්‍යායතනයේ පුහුණු වැඩසටහන**

2017 වසරේ දෙසැම්බර් මස සිට දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිවරයා සහ පරිපාලන නිලධාරිවරයා ඉහත එක් අවුරුදු වැඩසටහන හදාරමින් සිටී.

**පොත් බැඳීම පිළිබඳ පුහුණු වැඩසටහන**

කාර්යාල කාර්ය සහයකයන් දෙදෙනෙකු ඉහත වැඩසටහනට සහභාගි විය.

**සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ වැඩමුළුව**

දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් සඳහා නායකත්වය පිළිබඳ තේමාව යටතේ 'හයි බ්‍රෑන්ඩ් ටීම්' ආයතනය විසින් පවත්වන ලද වැඩමුළුවට සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සහභාගි විය.

**රාජ්‍ය කළමනාකරණසහකාරවරුන් සඳහා වූ වැඩමුළුව**

''ආකල්ප සංවර්ධනය'' යන තේමාව යටතේ 'හයි බ්‍රෑන්ඩ් ටීම්' ආයතනය විසින් පවත්වන ලද වැඩමුළුවට රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සහභාගි විය.

**කාර්යාල කාර්ය සහයකයන් සඳහා වූ වැඩමුළුව**

''ආකල්ප සංවර්ධනය'' යන තේමාව යටතේ 'හයි බ්‍රෑන්ඩ් ටීම්' ආයතනය විසින් පවත්වන ලද වැඩමුළුවට කාර්යාල කාර්ය සහයකයන් දස දෙනෙකු සහභාගි කරවන ලදී.


**රියදුරන් සඳහා වූ පුහුණු වැඩ සටහන**

ඉහත වැඩ සටහනට රියදුරන් දෙදෙනෙකු සහභාගි කරවන ලදී.

# 3 වන කොටස - මූල්‍යකාර්යකරණය සහ විශ්ලේෂණය

## 3.1 මූල්‍යකාර්යකරණ මිණුම්දඬු හා වාර්තාකරණය

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| තථ්‍ය ගාස්තු | Rs.59,347,000 | Rs.59,347,000 | Rs.101,280,582 | Rs.53,047,155. | Rs. 132,085,894.53 | Rs. 164,110,234.13 |
| කල්පිත ගාස්තු | Rs.30,000,000 | Rs.30,000,000 | Rs.30,000,000 | Rs.60,000,000 | Rs. 60,000,000 | Rs. 75,000,000 |



# 4 වන කොටස - අනුමත සේවක සංඛ්‍යාව හා මානව සම්පත

## 4.1 *දෙසැම්බර් මස 31 වන දිනට සේවක සංඛ්‍යාව*

| **තනතුර(අනුමත සේවක සංඛ්‍යාව/දැනට සිටින සේවක සංඛ්‍යාව)** | **අනුමත සේවක** සංඛ්‍යාව **(නව)** | දැනට **සිටින සේවක** සංඛ්‍යාව | **පුරප්පාඩු** |
|---|---|---|---|
| රජයේ ප්‍රධාන තක්සේරුකරු | 01 | 01 | 0 |
| අතිරේක ප්‍රධාන තක්සේරුකරු | 04 | 01 | 03 |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු / පළාත් තක්සේරුකරු | 16 | 02 | 14 |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 01 | 0 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | 0 |
| ගණකාධිකාරී | 01 | 0 | 01 |
| ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු / දිස්ත්‍රික් තක්සේරුකරු | 80 | 9 | 71 |
| තක්සේරුකරු / සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු | 120 | 27 | 93 |
| නීති නිලධාරී | 02 | 01 | 01 |
| පරිපාලන නිලධාරී | 02 | 02 | 0 |
| තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරී | 02 | 0 | 02 |
| භාෂා පරිවර්තක (සිංහල - දෙමළ) | 01 | 0 | 01 |
| සහකාර තක්සේරුකරු / සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු | 360 | 328 | 32 |
| අයවැය සහකාර | 01 | 01 | 0 |
| සංවර්ධන නිලධාරී | 26 | 26 | 0 |
| තොරතුරුසන්නිවේදන හා තාක්ෂණසහකාර | 3 | 0 | 3 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 103 | 93 | 10 |
| රියදුරු | 18 | 16 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 74 | 66 | 8 |
| සංචාරක බංගලා භාරකරු | 04 | 02 | 2 |
| **එකතුව** | 821 | **577** | **244** |

**2017 මූල්‍ය ප්‍රගතිය**

තක්සේරු දෙපාර්තමේන්තුව
ශීර්ෂය : 251 වැඩසටහන : 01
ව්‍යාපෘතිය : 01

| වැය ශීර්ෂය | විස්තරය | ප්‍රතිපාදනය 2017.12.31 | වියදම 2017.12.31 | ඉතුරුම් | වියදමෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | 387,321,000 | 360,513,192 | 26,807,808 | 93.08 |
| | **පුද්ගල පඩිනඩි** | **318,000,000** | **291,867,580** | **26,132,420** | 91.78 |
| 1001 | වැටුප් හා වේතන | 183,000,000 | 182,981,540 | 18,460 | 99.99 |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | 4,500,000 | 4,499,870 | 130 | 100.00 |
| 1003 | වෙනත් දීමනා | 130,500,000 | 104,386,171 | 26,113,829 | 79.99 |
| | ගමන් වියදම් | **14,306,107** | **13,964,275** | **341,833** | 97.61 |
| 1101 | දේශීය | 11,985,107 | 11,737,353 | 247,754 | 97.93 |
| 1102 | විදේශීය | 2,321,000 | 2,226,921 | 94,079 | 95.95 |
| | සැපයුම් | **7,100,000** | **6,981,210** | **118,790** | 98.33 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අඩුවැඩිය | 3,800,000 | 3,780,532 | 19,468 | 99.49 |
| 1202 | ඉන්ධන | 3,000,000 | 2,918,919 | 81,081 | 97.30 |
| 1203 | ආහාර වට්ටෝරු සහ නිල ඇඳුම් | 300,000 | 281,760 | 18,240 | 93.92 |
| | **නඩත්තු වියදම්** | **3,800,000** | **3,643,667** | **156,333** | 95.89 |
| 1301 | වාහන | 2,200,000 | 2,195,314 | 4,686 | 99.79 |
| 1302 | දේපළ, පිරියත සහ උපකරණ | 1,200,000 | 1,135,452 | 64,548 | 94.62 |
| 1303 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 400,000 | 312,901 | 87,099 | 78.23 |
| | **සේවා** | **35,234,000** | **35,175,926** | **58,075** | 99.84 |
| 1401 | ප්‍රවාහන | 1,800,000 | 1,800,000 | - | 100.00 |
| 1402 | තැපැල් හා සංදේශනය | 4,800,000 | 4,798,760 | 1,240 | 99.97 |
| 1403 | විදුලිය හා ජලය | 7,900,000 | 7,898,728 | 1,272 | 99.98 |
| 1404 | කුලී සහ දේශීය බදු | 12,834,000 | 12,811,682 | 22,318 | 99.83 |
| 1409 | වෙනත් | 7,900,000 | 7,866,755 | 33,245 | 99.58 |
| | පැවරුම් | **8,880,893** | **8,880,534** | **359** | 100.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1506 | රජයේ සේවකයන්ට දේපළ ණය පොලී | 8,866,000 | 8,865,641 | 359 | 100.00 |
| 1701 | අලාභ හා කපා හැරීම් | 14,893 | 14,893 | - | 100.00 |
| | **ප්‍රාග්ධන වියදම්** | 2,528,500,000 | 1,088,725,772 | 1,439,774,228 | 43.06 |
| | **ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **12,500,000** | **10,136,598** | **2,363,402** | 81.09 |
| 2001 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 9,000,000 | 7,682,024 | 1,317,976 | 85.36 |
| 2002 | දේපළ, පිරියත සහ උපකරණ | 2,000,000 | 1,007,847 | 992,153 | 50.39 |
| 2003 | වාහන | 1,500,000 | 1,446,727 | 53,273 | 96.45 |
| | **ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම්** | **4,000,000** | **3,952,684** | **47,316** | 98.82 |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 2,000,000 | 1,989,717 | 10,283 | 99.49 |
| 2103 | දේපළ, පිරියත සහ උපකරණ | 2,000,000 | 1,962,967 | 37,033 | 98.15 |
| | ධාරිතා වර්ධනය | **11,000,000** | **8,327,100** | **2,672,900** | 75.70 |
| 2104 | කාර්ය මණ්ඩල පුහුණුව | 11,000,000 | 8,327,100 | 2,672,900 | 75.70 |
| | **රාජ්‍ය දේපළ තක්සේරු කිරීම** | **1,000,000** | **1,000,000** | **-** | 100.00 |
| 2509 | වෙනත් | 1,000,000 | 1,000,000 | - | 100.00 |
| | **රජයට පවරාගත් ඌණ කාර්යකරණයක් සහිත** | **2,500,000,000** | **1,065,309,390** | **1,434,690,610** | 42.61 |
| | **ව්‍යවසාය සහ වත්කම් සඳහා වන්දි** | | | | |
| 2501 | ප්‍රතිව්‍යුහගත කිරීම | 2,500,000,000 | 1,065,309,390 | 1,434,690,610 | 42.61 |
| | **මුළු වියදම** | 2,915,821,000 | 1,449,238,963 | 1,466,582,037 | 49.70 |

RATE PER CENT

| 8 | 8.5 | 9 | 9.5 | 10 | 11 | 12 | 13 | Yrs. |
|---|---|---|---|---|---|---|---|---|
| 0.926 | 0.922 | 0.917 | 0.913 | 0.909 | 0.901 | 0.893 | 0.885 | 1 |
| 1.739 | 1.724 | 1.709 | 1.695 | 1.681 | 1.653 | 1.626 | 1.600 | 2 |
| 2.458 | 2.429 | 2.399 | 2.371 | 2.343 | 2.290 | 2.238 | 2.189 | 3 |
| 3.100 | 3.052 | 3.006 | 2.962 | 2.919 | 2.836 | 2.758 | 2.684 | 4 |
| 3.674 | 3.608 | 3.544 | 3.482 | 3.423 | 3.310 | 3.204 | 3.104 | 5 |
| 4.192 | 4.106 | 4.024 | 3.944 | 3.868 | 3.724 | 3.590 | 3.466 | 6 |
| 4.662 | 4.556 | 4.454 | 4.357 | 4.264 | 4.090 | 3.929 | 3.781 | 7 |
| 5.089 | 4.963 | 4.842 | 4.728 | 4.619 | 4.415 | 4.228 | 4.057 | 8 |
| 5.479 | 5.333 | 5.194 | 5.063 | 4.938 | 4.706 | 4.494 | 4.301 | 9 |
| 5.837 | 5.671 | 5.515 | 5.367 | 5.227 | 4.967 | 4.732 | 4.518 | 10 |
| 6.166 | 5.982 | 5.808 | 5.644 | 5.489 | 5.204 | 4.946 | 4.713 | 11 |
| 6.470 | 6.267 | 6.077 | 5.898 | 5.729 | 5.418 | 5.140 | 4.889 | 12 |
| 6.751 | 6.531 | 6.324 | 6.131 | 5.948 | 5.614 | 5.316 | 5.047 | 13 |
| 7.013 | 6.775 | 6.553 | 6.345 | 6.150 | 5.794 | 5.476 | 5.192 | 14 |
| 7.256 | 7.002 | 6.765 | 6.543 | 6.336 | 5.959 | 5.623 | 5.324 | 15 |
| 7.482 | 7.212 | 6.961 | 6.727 | 6.508 | 6.111 | 5.759 | 5.445 | 16 |
| 7.694 | 7.409 | 7.144 | 6.898 | 6.668 | 6.251 | 5.883 | 5.556 | 17 |
| 7.893 | 7.593 | 7.315 | 7.057 | 6.817 | 6.382 | 5.999 | 5.659 | 18 |
| 8.079 | 7.765 | 7.475 | 7.206 | 6.955 | 6.503 | 6.106 | 5.754 | 19 |
| 8.254 | 7.927 | 7.624 | 7.344 | 7.084 | 6.616 | 6.205 | 5.843 | 20 |
| 8.419 | 8.079 | 7.765 | 7.475 | 7.205 | 6.721 | 6.298 | 5.925 | 21 |
| 8.574 | 8.222 | 7.897 | 7.597 | 7.319 | 6.820 | 6.384 | 6.001 | 22 |
| 8.721 | 8.356 | 8.021 | 7.712 | 7.426 | 6.912 | 6.465 | 6.073 | 23 |
| 8.860 | 8.484 | 8.139 | 7.820 | 7.526 | 6.999 | 6.541 | 6.140 | 24 |
| 8.991 | 8.604 | 8.249 | 7.923 | 7.621 | 7.081 | 6.613 | 6.203 | 25 |
| 9.116 | 8.718 | 8.354 | 8.019 | 7.710 | 7.158 | 6.680 | 6.262 | 26 |
| 9.234 | 8.827 | 8.454 | 8.111 | 7.795 | 7.231 | 6.743 | 6.317 | 27 |
| 9.347 | 8.929 | 8.548 | 8.197 | 7.875 | 7.300 | 6.803 | 6.370 | 28 |
| 9.454 | 9.027 | 8.637 | 8.280 | 7.950 | 7.365 | 6.860 | 6.419 | 29 |
| 9.556 | 9.120 | 8.722 | 8.358 | 8.022 | 7.427 | 6.913 | 6.466 | 30 |
| 9.653 | 9.208 | 8.803 | 8.432 | 8.091 | 7.485 | 6.964 | 6.511 | 31 |
| 9.746 | 9.293 | 8.880 | 8.503 | 8.156 | 7.541 | 7.012 | 6.553 | 32 |
| 9.834 | 9.373 | 8.954 | 8.570 | 8.218 | 7.594 | 7.058 | 6.593 | 33 |
| 9.919 | 9.450 | 9.024 | 8.634 | 8.277 | 7.644 | 7.101 | 6.630 | 34 |
| 10.000 | 9.524 | 9.091 | 8.695 | 8.333 | 7.692 | 7.143 | 6.667 | 35 |
| 10.077 | 9.594 | 9.155 | 8.754 | 8.387 | 7.738 | 7.182 | 6.701 | 36 |
| 10.152 | 9.661 | 9.216 | 8.810 | 8.438 | 7.782 | 7.220 | 6.734 | 37 |
| 10.223 | 9.726 | 9.275 | 8.864 | 8.487 | 7.823 | 7.256 | 6.765 | 38 |
| 10.291 | 9.787 | 9.331 | 8.915 | 8.535 | 7.863 | 7.290 | 6.795 | 39 |
| 10.357 | 9.847 | 9.385 | 8.964 | 8.580 | 7.902 | 7.323 | 6.823 | 40 |
| 10.420 | 9.904 | 9.436 | 9.011 | 8.623 | 7.938 | 7.354 | 6.851 | 41 |
| 10.480 | 9.958 | 9.486 | 9.057 | 8.664 | 7.973 | 7.385 | 6.877 | 42 |
| 10.539 | 10.011 | 9.534 | 9.100 | 8.704 | 8.007 | 7.413 | 6.902 | 43 |
| 10.595 | 10.062 | 9.580 | 9.142 | 8.742 | 8.039 | 7.441 | 6.926 | 44 |
| 10.649 | 10.110 | 9.624 | 9.182 | 8.779 | 8.070 | 7.468 | 6.949 | 45 |
| 10.701 | 10.157 | 9.666 | 9.221 | 8.814 | 8.100 | 7.493 | 6.971 | 46 |
| 10.751 | 10.202 | 9.707 | 9.258 | 8.848 | 8.129 | 7.518 | 6.992 | 47 |
| 10.799 | 10.246 | 9.746 | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] |